සබරගමුව පළාත් සභාව - சப்பிரகமுவ மாகாண சபை - Sabaragamuwa Provincial Council

**අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

**கல்வி தகவல் தொழில் நுட்பம் மற்றும் கலாசார நடவடிக்கைகளுக்கான அமைச்சு**

Ministry Of Education, Information Technology & Cultural Affairs

*Email||:edusabaram@gmail.com Facebook||:SabEducationMinistry*

124

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My Number | ME/E/2(සබර/චක්‍රලේඛ) | ඔබේ අංකය<br>உமது இல<br>Your Numbe | | දිනය<br>திகதி<br>Date | 2014.04. 23 |

**පළාත් අධ්‍යාපන චක්‍රලේඛ අංක**
**: සබර/2014/16**

සියළුම විදුහල්පතිවරුන් වෙත,

**"පළාත් සමනලයින්" ප්‍රකාශයට පත් කිරීම**

2014.02.28 වන දින පැවැති මධ්‍යම රජයේ අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයක් අනුව ශ්‍රී ලංකාවේ සෑම පළාතකටම "පළාත් සමනලයින්" ප්‍රකාශයට පත් කිරීමට පියවර ගෙන ඇත.

02. පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය විසින් නිකුත් කර ඇති *ශ්‍රී ලංකාවේ පළාත් සමනලුන්* දැක්වෙන ඡායාරූප සහ නම් ඇතුලත් පත්‍රිකාවක් මේ සමග ඔබගේ විශේෂ අවධානය සඳහා එවමි.

03. එමෙන්ම පළාත් සමනලයින් ප්‍රකාශයට පත්කිරීමට පසුබිම් වූ කරුණු සහ තොරතුරු පහතින් දක්වන අතර එම කරුණු සියළුම පාසල් දරුවන්ගේ දැන ගැනීමට සලස්වන මෙන් හා ඊට අවශ්‍ය කටයුතු යොදන ලෙස කාරුණිකව දන්වමි.

- **පසුබිම**

  සමනලයා ජෛව විද්‍යාත්මක හා සංස්කෘතිකමය වශයෙන් වැදගත් වන කාණ්ඩයකට අයත් ජීවී විශේෂයකි. ශ්‍රී ලංකාවේ සමනල විශේෂ 245 ක් වාර්තා වන අතර ඉන් 26ක් ආවේණික විශේෂ වේ. වාර්තා වූ සමනලයන් අතුරින් විශේෂ 99ක් තර්ජනයට ලක්වූ ජීවී කාණ්ඩයකට ඇතුලත් වේ. වාසස්ථාන වල ගුණාත්මකභාවය හායනයවීම හා කැබලිකිරීම සහ පරිසර දූෂණය වැනි දෑ මගින් ඔවුන්ගේ ගහණය දැනට සීඝ්‍රයෙන් අඩු වෙමින් පවතී.

- ඕනෑම ජීවී විශේෂයක් පළාත් මට්ටමෙන් ප්‍රකාශයට පත් කිරීම තුලින් ජාතියක අනන්‍යතාවය හා ජෛව විද්‍යාත්මක උරුමය ස්ථාපනය කිරීමට එය බෙහෙවින් උපකාරීවේ. ජීවියා වෙසෙන පරිසර පද්ධති හා එම පරිසර පද්ධති වල සිටින අනිකුත් ජීවීන්ගේ සංරක්ෂණය සඳහාද ජනතා සහභාගිත්වය හා සහයෝගය ලබා ගැනීමටද එය බෙහෙවින් වැදගත්වනු ඇත. මේ නිසා පළාත් සමනලයකු ප්‍රකාශයට පත් කිරීම මගින් හා ප්‍රාදේශීය ප්‍රජාව දැනුවත් වීම තුලින් ශ්‍රී ලංකාවේ සමනලයන් සහ ඔවුන්ගේ වාසස්ථාන සංරක්ෂණය වීම තහවුරු වේ.

**ගරු අමාත්‍යතුමා** Hon.Minister Office-045-5623222,045-2287306 Residence-045-2222538 Mobile-077-9102001 Fax 045 2228042

**අමාත්‍යාංශ ලේකම්** Secretary Office-045-2223015 Residence-045-2232985 Mobile-071-4402000 email-meweerasooriya@gmail.com

**කාර්යාලය** Office නවනගරය,රත්නපුර. Newtown,Rathnapura. Office-045-2222542 Fax-045-2228042

❖ විස්තරය

පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය යටතේ පත් කරන ලද සමනලුන් පිළිබද විශේෂඥයන්ගේ කමිටුව මගින් පිලියෙල කරන ලද ' සමනලුන් සංරක්ෂණය සඳහා ක්‍රියාකාරී සැලැස්මෙ' හි පළාත් සමනලුන් තෝරා ඇත්තේ ඔවුන්ගේ ආවේණිකතාවය, පළාතේ සුලභව දැකිය හැකි වීම හා ආකර්ශණීය බාහිර රූපාකාරයක් දැරීම යන කරුණු පදනම් කරගෙනය. මෙම සමනලුන් ධජධාරී විශේෂ ලෙස නම් කල හැකි අතර, ඔවුන් ජීවන චක්‍රයේ පළිබෝධක අවධි නොපෙන්වයි. රෝග වාහක ලක්ෂණ නොපෙන්වයි හා සංස්කෘතික හා අධ්‍යාත්මික විශ්වාස පිළිබද ඍණාත්මක බලපෑමක් ඇති නොකරයි.

Ministry of Provincial Education * Sabaragamuwa *

මහින්ද එස්. වීරසූරිය
ලේකම්
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව
නව නගරය - රත්නපුර.

මහින්ද එස්.වීරසූරිය,
ලේකම්,
අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

පිටපත් 01. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ - දැ.පි. හා අ.ක.ස.
02. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - දැ.පි. හා අ.ක.ස.
03. කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරු - ඔබගේ කොට්ඨාශයේ ඇති සියළුම පාසල් වල විදුහල්පතිවරුන් වෙත මෙම චක්‍රලේඛය ලබාදෙන ලෙස දන්වමි.